# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සූතිකාධාර (සංශෝධන)

**(140 වන අධිකාරය වූ) සූතිකාධාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා විසින්
2018 මැයි මස 11 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2018 අප්‍රේල් මස 18 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[248 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 12.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් සූතිකාධාර ආඥාපනතේ (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 3 වන වගන්තියේ 1 වන උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, සහ එහි නීතිය බලපෑමේ ප්‍රකාශය වනුයේ සූතිකාධාර ගෙවිය යුත්තේ කිනම් කාලසීමාවකට ද, යන්න තීරණය කිරීමයි.

***3 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥපතියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සහ එහි නීතිය බලපෑමේ ප්‍රකාශය වනුයේ ගැහැණු කම්කරුවකු සඳහා ගෙවිය යුතු නියමිත සූතිකාධාර අනු ප්‍රමාණ සම්බන්ධව විධිවිධාන සැලසීමයි.

***4 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සහ එහි නීතිය බලපෑමේ ප්‍රකාශය වගකීම වනුයේ ගැහැණු කම්කරුවකු විසින් එකම ප්‍රසූතිය සම්බන්ධයෙන් එක් සේවායෝජකයකුට වඩා වැඩි සේවායෝජකයන් ගණනකින් සූතිකාධාර ඉල්ලීම නොකළ යුතු බවට විධිවිධාන සැලසීමයි.

***5 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සහ එහි නීතිය බලපෑමේ ප්‍රකාශය වනුයේ දරු ප්‍රසූතිය සිදුකළ ගැහැණු කම්කරුවකු විසින් එම දරු ප්‍රසූතිය සම්බන්ධව නිවාඩු ගණනය කිරීමේ අරමුණ ඉටුකර ගැනීම සඳහා එම ප්‍රසූතිය සිදුවූ දිනය සම්බන්ධයෙන් සේවායෝජකයාට දැනුම් දිය යුතු බවයි.

***6 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සහ එහි නීතිය බලපෑමේ ප්‍රකාශය වනුයේ සූතිකාධාර ගෙවනු ලැබීම සඳහා හිමිකම් දරන කාලසීමාව තීරණය කිරීමේ කාර්යය සඳහා ඇය විසින් සිය ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහිවී ද නොවී ද යන්න තම සේවායෝජකයාට දැනුම් දිය යුතු බවයි.

***7 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සහ එහි නීතිය බලපෑමේ ප්‍රකාශය වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ "විකල්ප සූතිකාධාර" යන වචන ඉවත් කිරීමයි.

***8 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සහ එහි නීතිය බලපෑමේ ප්‍රකාශය වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය එහි (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය ඉවත් කිරීමෙන් සංශෝධනය කිරීම යි.

# සූතිකාධාර (සංශෝධන)

එල්. ඩී.— ඕ. 23/2015.

**(140 වන අධිකාරය වූ ) සූතිකාධාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2018 අංක    දරන සූතිකාධාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

140 වන අධිකාරයේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සූතිකාධාර ආඥාපනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) යම් ගැහැණු කම්කරුවකුට සූතිකාධාර ගෙවනු ලැබීමට හිමිකම් ඇත්තේ යම් කාලසීමාවකට ද, ඒ කාලසීමාව පහත දැක්වෙන පරිදි විය යුතු ය:—

(අ) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි වුවහොත්, ප්‍රසූති දිනය ද ඇතුළුව ඒ දිනය දක්වා සති දෙකක් ද ඒ දිනයෙන් ඉක්බිතිව ම සති දහයක් ද, යන ආකාරයෙන් සති දොළහක් ; සහ

(ආ) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි නොවුවහොත්, ප්‍රසූති දිනය ද ඇතුළුව ඒ දිනය දක්වා සති දෙකක් සහ ඒ දිනයෙන් ඉක්බිතිව ම සති හතරක් ද යන ආකාරයෙන් සති හයක්:

එසේ වුව ද, (අ) සහ (ආ) ඡේදවල සඳහන් ඉහත කී සති දෙකේ කාලසීමාව ඇතුළත යම් දින ගණනක් එම ගැහැණු කම්කරුවකු, ස්වකීය සේවා නියුක්තියෙහි සේවය කර ඇති අවස්ථාවක, ප්‍රසූතියෙන් පසුව, අවස්ථාවෝචිත පරිදි, ඉහත කී සති දහයේ හෝ සති හතරේ කාලසීමාව අවසන්වීමෙන් ඉක්බිතිව ම එළඹෙන දිනයෙන් ආරම්භ වන එකී දින ගණන සඳහා සූතිකාධාර ගෙවනු ලැබීමට, ඇයට හිමිකම තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:—

“සේවායෝජකගේ වගකීම සහ සූතිකාධාර අනු ප්‍රමාණ.

5. (1) ගැහැණු කම්කරුවකුගේ සේවායෝජක විසින් එම කම්කරුවාට—

(අ) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි වුවහොත්, ප්‍රසූතියට පෙරාතුවම වූ සති දෙකක කාලසීමාව සහ ඇයගේ ප්‍රසූති දිනයෙන් ඉක්බිතිව ම පසුව එළඹෙන සති දහයක කාලසීමාව යන සම්පූර්ණ කාලසීමාව සඳහා ද; සහ

(ආ) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි නොවුවහොත්, ප්‍රසූතියට පෙරාතුවම වූ සති දෙකක කාලසීමාව සහ ප්‍රසූතියෙන් ඉක්බිතිව ම පසුව එළඹෙන සති හතරක කාලසීමාව යන සම්පූර්ණ කාලසීමාව සඳහා ද,

නියමිත අනු ප්‍රමාණයන් අනුව සූතිකාධාර ගෙවිය යුතු ය:

එසේ වුව ද, එවැනි ගැහැණු කම්කරුවකු, (අ) සහ (ආ) ඡේදවල සඳහන් පරිදි ඉහත කී සති දෙකේ කාලසීමාව ඇතුළත, ඇයගේ සේවා නියුක්තියෙහි යම් දින ගණනක් සේවය කර ඇති අවස්ථාවක, ඇයට එකී දින ගණන සඳහා ඇයගේ දරු ප්‍රසූතියෙන් ඉක්බිතිව, සූතිකාධාර ගෙවනු ලැබීමට හිමිකම තිබිය යුතු ය.

(2) මෙම වගන්තිය යටතේ සූතිකාධාර ගෙවනු ලැබීමට හිමිකම් ලබන කාලසීමාව ඇය හිමිකම් දරන පොදු නිවාඩුවලට හෝ ලබාගන්නා නිවාඩුවලට අතිරේක ව විය යුතු ය.”.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

“ගැහැණු කම්කරුවකු විසින් එකම ප්‍රසූතිය සම්බන්ධයෙන් එක් සේවායෝජකයකුට වඩා වැඩි සේවායෝජකයන් ගණනකින් සූතිකාධාර ඉල්ලා සිටීම නොකළ යුතු බව.

6. මෙහි 5 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මෙම ආඥාපනත යටතේ එකම ප්‍රසූතිය සම්බන්ධයෙන් එක් සේවායෝජකයකුට වඩා වැඩි සේවායෝජකයින් ගණනකින් යම් ගැහැණු කම්කරුවකු සූතිකාධාර ඉල්ලා සිටීම සඳහා එමගින් හිමිකම් ලබන බවට සලකනු නොලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) දරු ප්‍රසූතියක් සිදු කළ ගැහැණු කම්කරුවකු විසින්, ඒ දරු ප්‍රසූතිය සිදු වී සතියක් ඇතුළත, ඒ ප්‍රසූතිය සිදු වූ දිනය, ඇයගේ සේවායෝජකයාට දැනුම් දිය යුතු අතර, ඇයට සේවා නියුක්තියෙන් බැහැරව සිටීමට හිමිකම ඇති දින ගණන තීරණය කිරීම සඳහා, ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි වීද, නොවීද යන්න නිශ්චිතව දැනුම් දිය යුතු ය. ";

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) (1) වන උපවගන්තිය යටතේ හෝ (2) වන උපවගන්තිය යටතේ වන දැනුම් දීමක් සේවායෝජක වෙත ගැහැණු කම්කරුවකුගෙන් ලැබුණු විට, එම සේවායෝජක විසින් එම ගැහැණු කම්කරුවාට—

(අ) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි වුවහොත්, ප්‍රසූතියට පෙරාතුවම සති දෙකක් සහ ප්‍රසූතියෙන් ඉක්බිතිව ම සති දහයක් ද; සහ

(ආ) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි නොවුවහොත්, ප්‍රසූතියට පෙරාතුවම වූ සති දෙකක් සහ ප්‍රසූතියෙන් ඉක්බිතිව ම සති හතරක් ද බැගින්,

ගැහැණු කම්කරුවකුට සේවා නියුක්තියෙන් බැහැරව සිටීමට අවසර දිය යුතු ය:

එසේ වුව ද, එම ගැහැණු කම්කරුවකු (අ) සහ (ආ) ඡේදවල සඳහන් ඉහත කී සති දෙකේ කාලසීමාව ඇතුළත ඇයගේ සේවා නියුක්තියෙහි යම් දින ගණනක් සේවය කර ඇති අවස්ථාවක, ප්‍රසූතියෙන් පසුව, අවස්ථාවෝචිත පරිදි, ඉහත කී සති දහයේ හෝ සති හතරේ කාලසීමාව අවසන් වීමෙන් ඉක්බිතිව ම එළඹෙන දිනයෙන් ආරම්භව, ඒ දින ගණන සඳහා ස්වකීය සේවා නියුක්තියෙන් බැහැරව සිටීමට ඇයට අවසර දිය යුතු ය.";

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට පසුව ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(5) ප්‍රසූතිය හේතුවෙන් මෙම පනත යටතේ ගැහැණු කම්කරුවකු වෙත හිමිවන නිවාඩු වෙනත් යම් නීතියක හෝ නියෝගයකට යටත්ව ඇයට හිමිවන පොදු නිවාඩුවලට හෝ ලබාගත් නිවාඩුවලට අතිරේක ව ලැබීමක් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ "එම ගැහැණු කම්කරුවකු සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"එම ගැහැණු කම්කරුවකු සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය:

එසේ වුව ද, එම ගැහැණු කම්කරුවාට සූතිකාධාර ගෙවනු ලැබීම සඳහා හිමිකම් දරන කාලසීමාව තීරණය කිරීම සඳහා ඇය විසින් සිය ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහිවීද, නොවීද යන්න තම සේවා යෝජකයාට දැනුම් දිය යුතු ය.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "සූතිකාධාර කිසිවකට හෝ විකල්ප සූතිකාධාර කිසිවකට බලනොපෑ යුතු ය." යන වචන වෙනුවට "සූතිකාධාර කිසිවකට බලනොපෑ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.